සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ගණිතය - 4 ශ්‍රේණිය

සැකසුම : රත්නපුර අධ්‍යාපන කලාපය

කේ.පී. ගීතානි දිල්රුක්ෂි - ර/රාජකීය විද්‍යාලය

පරිගණක සහය: ආර්.කේ.ඕ.කෞශල්‍යා රණසිංහ - ර/ශාන්ත ඇලෝසියස් ජාතික පාසල

2 පාඩම - එකතු කිරීම - 1

පෙර වැඩ කාර්ය පත්‍රිකාව

➢ පහත සංඛ්‍යා කාඩ්පත් සූදානම් කරගන්න.

- රතු කාඩ්පත්වල මෙම සංඛ්‍යා ලියා ගනිමු.

325 437 136

- නිල් පාට කාඩ්පත්වල මෙම සංඛ්‍යා ලියා ගනිමු.

283 371 560

සංඛ්‍යා ඉණිමග ක්‍රීඩාව සඳහා පහත ආකාරයට කාඩ්පත් සූදානම් කරගන්න.

- සෙන්ටිමීටර දෙකක් පළල, සෙන්ටි මීටර් හයක් දිග කොළපාට කාඩ්පත්වල මෙම සංඛ්‍යා ලියාගන්න.


418 135 207 329

- සෙන්ටිමීටර දෙකක් පළල, සෙන්ටිමීටර හයක් දිග කහ පාට කාඩ්පත්වල මෙම සංඛ්‍යා ලියාගන්න.

274 481 153 362

- වැඩිහිටියෙකුගේ උදව් ලබමින් කාඩ්බෝඩ් එකක් මත පහත දක්වා ඇති සංඛ්‍යා ඉණිමග ඇඳගන්න.
- ඉණිමග එක් කොටුවක තරම, උස සෙන්ටිමීටර දෙකක් හා පළල සෙන්ටිමීටර හයකි.

(ඔබ සූදානම් කරගත් සංඛ්‍යාපතක් තැබීමට හැකි ප්‍රමාණය විය යුතු ය.)





- විනෝදයට මෙහි ඉතිරි හිස් කොටු පිරවීමට ඔබත් උත්සහ කරන්න.

තිරස් හා සිරස් අතට ඇති සංඛ්‍යා වල එකතුව සොයමු.

| + | 3 | 6 | 2 | 7 | 5 |
|---|---|---|---|---|---|
| 1 | | | | | |
| 4 | | | | | |
| 8 | | | | 15 | |
| 0 | | 6 | | | |
| 9 | | | | | 14 |

එකතු කරමින් අවසන් කොටුව තෙක් යාමට ඔබට හැකි ද?



සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ගණිතය - 4 ශ්‍රේණිය

සැකසුම : රත්නපුර අධ්‍යාපන කලාපය

කේ.පී. ගීතානි දිල්රුක්ෂි - ර/රාජකීය විද්‍යාලය

පරිගණක සහය: ආර්.කේ.ඕ.කෞශල්‍යා රණසිංහ - ර/ශාන්ත ඇලෝසියස් ජාතික පාසල

2 පාඩම - එකතු කිරීම - 1

පැවරුම

**සූදානම් කරගත් රතුපාට සංඛ්‍යා කාඩ්පත් හා නිල්පාට සංඛ්‍යා කාඩ්පත් මේසය මත තබමු.**

| | | |
|---|---|---|
| 325 | 437 | 136 |
| 283 | 371 | 560 |

**සංඛ්‍යා කාඩ්පත් ඇසුරෙන් පිළිතුරු සොයමු.**

I. ඔබ කැමති රතු සංඛ්‍යා කාඩ්පත් දෙකක එකතුව කීයදැයි පවසන්න.

II. ඔබ කැමති නිල් පාට කාඩ්පත් දෙකක එකතුව සොයන්න.

III. පිළිතුර 461 ලබාගැනීමට එකතු කළ යුතු රතුපාට සංඛ්‍යා කාඩ්පත් මොනවා ද?

IV. වැඩි ම අගයක් එකතුව ලෙස ලබාගැනීමට එකතු කළයුතු නිල්පාට සංඛ්‍යා කාඩ්පත් මොනවා ද?

V. නිල් සංඛ්‍යාපත් දෙකක එකතුව 654 විය. එම සංඛ්‍යාපත් මොනවා ද?

VI. වැඩිම අගයක් එකතුව ලෙස ලබාගැනීමට එකතු කළයුතු රතු සංඛ්‍යාපත් මොනවා ද?

**හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරන්න.**

| | | | |
|---|---|---|---|
| **I.** | **425 + .......** | **= 751** | **( 336 / 326 / 236 )** |
| **II.** | **........... + 274** | **= 637** | **( 253 / 352 / 363 )** |
| **III.** | **208 + 307** | **= ........** | **( 505 / 515 / 605 )** |

**එකතුව සොයන්න.**

i. 259 + 105 = ____

ii. 362 + 163 = ____

iii. 454 + 73 = ____

iV. 309 + 203 = ____

iV. 458 + 105 = ____

Vi. 72 + 173 = ____

Vii. 254 + 228 = ____

Viii. 462 +155 = ____

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ගණිතය - 4 ශ්‍රේණිය

සැකසුම : රත්නපුර අධ්‍යාපන කලාපය

කේ.පී. ගීතානි දිල්රුක්ෂි - ර/රාජකීය විද්‍යාලය

පරිගණක සහය: ආර්.කේ.ඕ.කෞශල්‍යා රණසිංහ - ර/ශාන්ත ඇලෝසියස් ජාතික පාසල

2 පාඩම - එකතු කිරීම - 1

පසු වැඩ කාර්ය පත්‍රිකාව

- **දුවේ පුතේ, අපි සංඛ්‍යා ඉණිමග දිගේ ඉහළට නැගීමේ ක්‍රීඩාව ආරම්භ කිරීමට සූදානම් වෙමු.**

**ක්‍රීඩාව - සංඛ්‍යා ඉණිමග දිගේ නගිමු.**

- **අවශ්‍ය සම්පත් :-**

- **සූදානම් කර ගන්නා ලද කහපාට සංඛ්‍යාපත්**
- **සූදානම් කර ගන්නා ලද කොළපාට සංඛ්‍යාපත්**

**සූදානම් කරගත් සංඛ්‍යා ඉණිමග**

- **තරඟ නීති :-**

- **එක් වරකට තැබිය හැක්කේ එකම වර්ණයේ සංඛ්‍යාපත් පමණි.**
- **එක් පිළිතුරක් ලබා ගැනීමට යොදාගත් සංඛ්‍යාපත් නැවත භාවිතා කළ නොහැකි ය.**

- **ක්‍රීඩාව ආරම්භ කිරීමේ පියවර :-**

**සංඛ්‍යා ඉණිමග, කොළ වර්ණයේ සංඛ්‍යා පත්, කහ වර්ණයේ සංඛ්‍යා පත් ඔබ ඉදිරියෙන් තබා ගන්න.**

i. පළමු රතු කොටුවේ ඇති සංඛ්‍යාව පිළිතුර ලෙස ලබා ගැනීමට එකතු කළයුතු සංඛ්‍යා දෙක ඊට පහළින් ඇති හිස් කොටු දෙක මත තෝරා තබන්න.

ii. දෙවන රතු කොටුවේ ඇති සංඛ්‍යාව පිළිතුර ලෙස ලබාගැනීමට එකතු කළ යුතු සංඛ්‍යා දෙවන රතු කොටුවට පහළින් ඇති හිස් කොටු මත තෝරා තබන්න.

මේ ආකාරයට තුන්වන රතු කොටුවේ පිළිතුරු සංඛ්‍යාවටත්, හතරවන රතු කොටුවේ පිළිතුරු සංඛ්‍යාවටත් ගැළපෙන සංඛ්‍යාපත් තෝරා හිස් කොටු මත තබන්න.

- ඔබ ඉණිමග දිගේ මුදුනටම නැග්ගා ද?
- එසේනම් කොඩියට හරියක් දමා එන්න.

(ඔබ නැවත වරක් ක්‍රීඩාවේ යෙදෙන්නේ නම් පළමු වටයට වඩා අඩු කාලයකදී ජය ලබාගත හැකි නම් ඔබ හපනෙකි.)